සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

7892

**අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)**

ශ්‍රේණිය / தரம் / Grade } 6 ශ්‍රේණිය

**ගණිතය**

කාලය / நேரம் / Time } පැය 2 යි

නම / பெயர் / Name } ..............................................................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ....................................

## I කොටස

★ **ප්‍රශ්න අංක 01 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
★ **එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ.**

---

01. හිස් කොටුවට ගැලපෙන සංඛ්‍යාව ලියන්න.

$1345 + 72 = \square$

---

02. දිනකදී ලොතරැයි දිනුම් සඳහා වෙන්කළ ත්‍යාග මුදල්වල මුළු වටිනාකම රුපියල් වලින් පහත දක්වා ඇත. එම සංඛ්‍යාව සම්මත ආකාරයට ලියන්න.

324734421

---

03. දක්වා ඇති රූපයෙන් කවර භාගයක් අඳුරු කර ඇත්ද ?



---

04. ලීටර $1\frac{1}{2}$ ක් ලෙස සටහන් කර ඇති භාජනයක ප්‍රමාණය මිලිලීටර කීයද ?

---

05.

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 4 | 35 |
| - | 2 | 50 |

---

06. වෘත්තය මත පිහිටි ලක්ෂ්‍යය ..........................................

වෘත්තය තුළ පිහිටි ලක්ෂ්‍යය ..........................................




---

07. 47 හා 53 අතර ඇති සියලුම ඉරට්ට සංඛ්‍යා ලියන්න.

---

08. විශාලත්වය අනුව a හා b කුමන කෝණ වර්ගයට අයත්ද ?

a - ..............................................................

b - ..............................................................



09. $-3$ සිට $+2$ දක්වා ඇති සියලුම නිඛිල ලියන්න.

10. එක් එක් රවුම තුළ ඇති සංඛ්‍යාව පිළිතුර වන පරිදි $+, -, \times, \div$ ලකුණු හිස් කොටු තුළ යොදන්න.




11. රූපයේ පරිමිතිය සොයන්න.




12. ජලය $5\,l$ක් ඇති භාජනයකින් $3\,l$ $435\,ml$ ප්‍රමාණයක් භාවිතයට ගත්තේ නම්, ඉතිරිවන ජල පරිමාව සොයන්න.

13. දී ඇති සංඛ්‍යා ඇතුළත් කාණ්ඩයට සුදුසු නමක් ලියන්න.

5 10 20 25 15

14. හිස්තැන් පුරවන්න.

2135 m = .................. km ............. m

15. බස්රථයක මගීන් $x$ සංඛ්‍යාවක් සිටී. නැවතුමකදී ඉන් හය දෙනෙකු බසයෙන් බැසගත් අතර තවත් මගීන් දෙදෙනෙකු බසයට නගින ලදී. බස්රථයේ සිටින මගීන් ගණන දැක්වීමට වීජීය ප්‍රකාශනයක් ලියා දක්වන්න.

16. 2, 1, 5, 7 යන ඉලක්කම් එක් වරක් පමණක් යොදා ගනිමින් සෑදිය හැකි, ඉලක්කම් හතරකින් යුත්,

i) විශාලතම සංඛ්‍යාව ලියන්න. ..........................................  ii) කුඩාතම සංඛ්‍යාව ලියන්න. ...............................

17. 4 : 7 අනුපාතයට තුල්‍ය අනුපාතයක් ලියන්න.

18. $\frac{8}{15} + \frac{7}{15}$ සුළු කරන්න.

19. 1 cm $\times$ 1 cm කොටු වලින් දක්වා ඇති රූපයේ අඳුරු කළ කොටසේ වර්ගඵලය සොයන්න.



20. පොල් ගොඩක ඇති ගෙඩි ගණන ආසන්න 10 ට වැටයූ විට 70 වේ. එහි තිබිය හැකි,

i) උපරිම පොල් ගෙඩි ගණන

ii) අවම පොල් ගෙඩි ගණන සොයන්න.

## II කොටස

★ ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

★ එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් හිමිවේ.

---

01. (a) දී ඇති සංඛ්‍යා ඇසුරෙන් එක් තීරුවකට සුදුසු සංඛ්‍යා 4 බැගින් යොදා වගුව සම්පූර්ණ කරන්න.

1, 2, 3, 4, 5

6, 7, 8, 9, 10

11, 12, 13, 14, 15

16, 17, 18, 19, 20

| | |
|---|---|
| 3 හි ගුණාකාර | |
| ප්‍රථමක සංඛ්‍යා | |
| සංයුක්ත සංඛ්‍යා | |
| ත්‍රිකෝණ සංඛ්‍යා | |
| සමචතුරස්‍ර සංඛ්‍යා | |

(ල. 2 × 5 =10)

(b) "අනුයාත ත්‍රිකෝණ සංඛ්‍යා දෙකක් එකතු කළ විට සමචතුරස්‍ර සංඛ්‍යාවක් ලැබේ." ඒ අනුව හිස්තැන්වලට සුදුසු සංඛ්‍යා ලියන්න.

.................. + .................. = 25 (ල. 02)

---

02. (a) A නම් ස්ථානයෙන් ගමන් අරඹන බාලදක්ෂ කණ්ඩායමක් G නම් ස්ථානයේ ඇති කඳවුරක් වෙත ගමන් කරන ආකාරය රූපයේ දැක්වේ. ඒ අනුව පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.




| ගමන් මඟ | දිශාව |
|---|---|
| A ⟶ B | ............................... |
| B ⟶ C | ............................... |
| E ⟶ F | ............................... |
| F ⟶ G | ............................... |

(ල. 04)

මෙහි

p යනු ............................ කෝණයකි.

q යනු ............................ කෝණයකි.

r යනු ............................ කෝණයකි.

s යනු ............................ කෝණයකි.

(ල. 04)

(b) හිස්තැන් සම්පූර්ණ කරන්න.

i) බිත්තියක ඇති මුහුණ බලන කණ්ණාඩියක් ......................... තලයක පිහිටයි.

ii) මේසයක මතුපිට ........................................... තලයක පිහිටයි.

iii) තලයක තිරස් බව හඳුනාගැනීමට ...................... ත් සිරස් බව හඳුනාගැනීමට ............................ ත් යන උපකරණ භාවිතා කරයි. (ල. 04)

---

03. i) $2 \times 2 \times 2 \times 2$ යන්න දර්ශක ආකාරයෙන් ලියන්න. (ල. 01)

ii) $2^3 \times 3^2$ ප්‍රසාරණය කර අගය සොයන්න. (ල. 04)

iii) හිස්කොටු සම්පූර්ණ කරන්න. (ල. 03)

$64 = 2^{\square} = 4^{\square} = \square^2$

iv) සුදුසු පරිදි =, >, < සංකේත යොදන්න. (ල. 04)

(a) 3 .......................... 2

(b) -4 .......................... -2

(c) 5 - 2 .......................... 2 + 1

(d) $-\frac{1}{2}$ .......................... 0

---

04. (a) i) $\frac{2}{5}$ , $\frac{1}{5}$ , $\frac{3}{10}$ , $\frac{1}{3}$ , $\frac{11}{2}$

දී ඇති භාග අතරින් ඒකක භාග තෝරා යටින් ඉරක් අඳින්න. (ල. 02)

ii) තුල්‍ය භාග අනුව හිස්කොටු සම්පූර්ණ කරන්න. (ල. 02)

$\frac{2}{5} = \frac{\square}{20} = \frac{6}{\square}$

iii) සුදුසු පරිදි =, >, < ලකුණ යොදන්න. (ල. 01)

$\frac{3}{10}$ ............ $\frac{2}{5}$

iv) $\frac{3}{5} - \frac{1}{20}$ සුළු කරන්න. (ල. 02)

(b) i) $\frac{7}{100}$ දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. (ල. 01)

ii) පහත සංඛ්‍යා ආරෝහණ පටිපාටියට සකස් කරන්න. (ල. 02)

0.7, 2.4, 2.15, 0.35

iii)

$$\begin{array}{r} 18.32 \\ +\ 7.5 \\ \hline \\ \hline \end{array}$$

සුළු කරන්න. (ල. 02)

---

05. (a)




i) තලරූප පිළිබඳ දැනුම භාවිතයෙන් මෙහි දැක්වෙන හැඩතල නම් කරන්න. (ල. 03)

a ..........................................................................

b ..........................................................................

ii) b රූපයෙහි ඇති විශේෂ ලක්ෂණය ලියන්න. (ල. 02)

(b)

(ල. 01)




i) මෙම පතරොම භාවිතයෙන් සෑදිය හැකි ඝන වස්තුවේ නම ලියන්න.

ii) එහි දාරයක දිග කොපමණද ? (ල. 01)

iii) එහි ඇති දාර සියල්ලෙහි දිගෙහි එකතුව සොයන්න. (ල. 02)

iv) එවැනි එකිනෙකට සමාන ඝනවස්තු දෙකක් එකට ඇල වූ විට ලැබෙන සංයුක්ත ඝන වස්තුවේ මුහුණත්, ශීර්ෂ හා දාර සංඛ්‍යා සොයන්න. (ල. 03)

---

06. සතියේ දින 5 තුළ ක්‍රීඩා සමාජයක සාමාජිකයන් එක් එක් දිනයේ පුහුණුවට පැමිණි සංඛ්‍යා පිළිබඳ තොරතුරු පහත වගුවේ හා පහත ප්‍රස්තාරයේ දැක්වේ.

| | |
|---|---|
| සඳුදා | ● ● ● ● ● |
| අඟහරුවාදා | ● ● ● ● ● ● ● |
| බදාදා | ● ● ● ● ◗ |
| බ්‍රහස්පතින්දා | |
| සිකුරාදා | |

| දිනය | සංඛ්‍යාව |
|---|---|
| සඳුදා | 20 |
| අඟහරුවාදා | |
| බදාදා | |
| බ්‍රහස්පතින්දා | 23 |
| සිකුරාදා | 12 |

i) සඳුදා පැමිණි සාමාජිකයන් ගණන 20 නම් ● රූපය මගින් කොපමණ සංඛ්‍යාවක් දැක්වේද ? (ල. 02)

ii) වගුවේ හිස්තැන් පුරවන්න. (ල. 02)

iii) බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවලට අදාල පැමිණීම චිත්‍ර ප්‍රස්තාරයේ දක්වන්න. (ල. 04)

iv) ක්‍රීඩා පුහුණුවන දිනකදී පැමිණි වැඩිම හා අඩුම සාමාජික සංඛ්‍යාවන් අතර වෙනස කොපමණද ? (ල. 02)

v) සඳුදා සහ සිකුරාදා දිනවල පැමිණි සාමාජික සංඛ්‍යාවන් අතර අනුපාතය ලියා එය සරලම ආකාරයෙන් දක්වන්න. (ල. 02)

07. (a)

| |
|---|
| පාසල් ත්‍යාග ප්‍රදානෝත්සවය 2024 මාර්තු 10 වන දින පෙ.ව. 11.30 සිට ප.ව. 2.15 දක්වා අලපලාදෙණිය විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේදී පැවැත්වේ. |

i) ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වෙන දිනය සම්මත ආකාරයට ලියන්න. (ල. 01)

ii) උත්සවය අවසන් වීමට නියමිත වේලාව පැය 24 ඔරලෝසුවෙන් දක්වන්න. (ල. 01)

iii) උත්සවය සඳහා වෙන්කර ඇති කාලය කොපමණද ? (ල. 02)

iv) විශේෂාංගයක් පෙ.ව. 11.50 ට ආරම්භ වී මිනිත්තු 5 තත්පර 45 ක කාලයක් පැවැත්වීමට නියමිත නම් එය නිමවීමට අදාල වේලාව පැය 12 ඔරලෝසු වේලාවෙන් දක්වන්න. (ල. 02)

(b) පාසලක 6 ශ්‍රේණියේ පිරිමි ළමයි $p$ ද ගැහැණු ළමයි 20 ක් ද සිටිති. පිරිමි ළමයි 4 දෙනෙකු ළඟ සහ ගැහැණු ළමයි $n$ ගණනක් ළඟ රතු පැන් තිබුණි. පහත අවස්ථා සඳහා වීජීය ප්‍රකාශන ලියා දක්වන්න.

i) පන්තියේ සිටින මුළු සිසුන් ගණන (ල. 01)

ii) රතු පැන් නොමැති ගැහැණු ළමයි ගණන (ල. 02)

iii) $P = 25$ නම් පන්තියේ සිටින මුළු සිසුන් ගණන (ල. 02)

iv) $n = 7$ නම් රතු පැන් නොතිබු ගැහැණු ළමයි ගණන (ල. 01)

අවසාන වාර පරීක්ෂණය -2023(2024)

**6 ශ්‍රේණිය -ගණිතය පිළිතුරු පත්‍රය**

| | | | | | |
|---|---|---|---|---|---|
| **I කොටස** | | | 11.)19cm 1mm | | 02 |
| 01.)1417 | | 02 | 12.)1 l 565ml | | 02 |
| 02.) 324 734 421 | | 02 | 13.)5 හි ගුණාකාර | | 02 |
| 03. $\frac{3}{7}$ | | 02 | 14.) 2km 135m | | 02 |
| 04.)1500m l | | 02 | 15.) x-6 +2 | | 02 |
| 05.)පැය 1 මිනි. 45 | | 02 | 16.) 7521<br>1257 | 1<br>1 | 02 |
| 06.) මත - A<br>තුල -C | 1<br>1 | 02 | 17.) 4:7 නිවැරදි ඕනෑම අගයක් | | 02 |
| 07.) 48, 50, 52 | | 02 | 18.) 1 | | 02 |
| 08.) a – පරාවර්ත කෝණය<br>b - මහා කෝණය | 1<br>1 | 02 | 19.)3 cm $^2$ | | 02 |
| 09.) -3, -2, -1, 0, 1 | | 02 | 20.) උපරිම - 74<br>අවම - 65 | | 02 |
| 10.) [1 \| - \| 2]<br>[÷ \| \| +]<br>[2 \| × \| 5]<br>ගණිත කර්ම 4ට | $\frac{1}{2}X4$ | 02 | | | |
| **II කොටස** | | | 5). I). a - ත්‍රිකෝණය<br>b - ත්‍රිපිසියම<br>II). එක් සම්මුඛ පාද යුගලයක් එකම පරතරයකින් පිහිටයි.<br>b). I). සවිධි චතුස්තලය<br>II). 15 cm<br>III).15×6 = 90cm<br>IV). මුහුණත් 6<br>ශීර්ෂ 5<br>දාර 9 | 1<br>2<br><br>1<br>1<br>1+1<br>1<br>1<br>1 | 03<br>02<br>04<br>03 |
| 1.) 3 ගුණාකාර - 3,6,9,12,15,18<br>ප්‍රථමක - 2,3,5,7,11,13,17,19<br>සංයුක්ත -4,6,8,10,12,14,15,16, 18,20<br>ත්‍රිකෝණ -1,3,6,10,15<br>සමචතුරස්‍ර - 1,4,9,16<br>b. 10+15 =25 | 2X5<br>02 | 10<br>02 | | | |
| (2) A → B = නිරිත<br>B → C = ගිණිකොණ<br>E → F = දකුණ<br>F → G = ඊසාන<br>P → සෘජුකෝණයකි.<br>Q → සරල කෝණයකි.<br>R → සෘජුකෝණයකි.<br>S → පරාවර්ත කෝණයකි.<br>b. I) සිරස්<br>II) තිරස්<br>III) ලෙවලය , ලඹයක් | 01<br>01<br>01<br>01<br>01<br>01<br>01<br>01<br>01<br>01<br>02 | 04<br>04<br>04 | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3.) 2×2×2×2 =2 $^{4}$<br>II). 2×2×2×3×3 = 72<br>III). $64 = 2^6 = 4^3 = 8^2$<br>IV) 3>2<br>-4 < -2<br>5-2 = 2+1<br>$-\frac{1}{2} < 0$ | 01<br>2+2<br>1+1+1<br>01<br>01<br>01<br>01 | 01<br>04<br>03<br><br><br><br>04 | 06.) I.) 4<br>II.) 7×4 = 28 අඟහරුවාදා<br>4× 4+ 2 = 18 බදාදා<br>III.)බ්‍රහස්: බෝල $5\frac{3}{4}$<br>සිකු:- බෝල 3<br>IV.) වැඩිම →28 අඩුම →12<br>28-12 = 16<br>V.) 20:12<br>5: 3 | 1<br>1<br>2<br>2<br>1<br>1<br>1<br>1 | 02<br>02<br>04<br>02<br>02 |
| 4). $\frac{1}{5}, \frac{1}{3}$<br>II). $\frac{2}{5} = \frac{8}{20} = \frac{6}{15}$<br>III). $\frac{3}{10} < \frac{2}{5}$<br>$\frac{3}{10} < \frac{4}{10}$<br>IV). $\frac{3}{5} - \frac{1}{20}$<br>$\frac{12}{20} - \frac{1}{20} = \frac{11}{20}$<br>b. $\frac{7}{100} = 0.07$<br>II) $\frac{7}{10}, \frac{24}{10}, \frac{215}{100}, \frac{35}{100}$<br>$\frac{70}{100}, \frac{240}{100}, \frac{215}{100}, \frac{35}{100}$<br>0.35, 0.7, 2.15, 2.4<br>III) 18.32<br>7. 5<br>25.82 | 1+1<br>1+1<br><br>1+1<br><br>1<br>1 | 02<br>02<br>01<br>02<br>01<br>02<br>02 | 07.) I). 2024 -03 -10<br>II). 14: 15<br>III). පැය 2 මි. 45<br>IV). පෙ.ව. 11.50.00<br>05.45<br>11.55.45<br>පෙ.ව. 11.55.45<br>b). පි ගැ<br>P 20 (P+20)<br>II). (20- n)<br>III). 25+20 = 45<br>IV). 20-7 =13 | 1+1<br>1+1 | 01<br>01<br>02<br>02<br>01<br>02<br>02<br>01 |

LOL.lk
**BookStore**

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**